ගණිතය - 5 ශ්‍රේණිය

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

**ප්‍රාථමික අංශය**

**සැකසුම ගුරු උපදේශිකා R.D පුෂ්පකාන්ති**

ආදරණීය දූ පුතුනි නිවසේම රැඳී සිටින මේ මොහොතෙයි මුදල් භාවිතය සහ ගනුදෙනු ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා විනෝදාත්මක විෂය සමගාමී ක්‍රියාකාරකමක යෙදෙමු.

## සෙල්ලම් කඩයක් දමමු

- නිවසේ ඇති ආහාර දවටන, සබන් දවටන,අනෙකුත් භාණ්ඩ වල දවටන හැකි තරම් රැස්කරගන්න. පෑන්, පැන්සල්, පොත් මකන කෑලි, පාට පෙට්ටි ආදියද ගන්න.

- භාණ්ඩ සඳහා මිල දර්ශනයක් ද සකස් කරගන්න.

- නිවසේ සුදුසු ස්ථානයක් තෝරා ගෙන සෙල්ලම් කඩයක් සකස් කරගන්න.

- එහි මිල දර්ශනයද ප්‍රදර්ශනය කරන්න.

- දැන් සත විසිපහ, සත පනහ, රුපියල, රුපියල් දෙක, රු.5.00, රු.10 කාසි අම්මගෙන් තාත්තගෙන් ඉල්ලගෙන කාසි පෙට්ටියක් සකස් කරගන්න.

- හැකිනම් රුපියල් 20 50,100,500,1000,5000 නෝට්ටු කඩදාසි වලින් සකස් කර ගන්න. ආරක්ෂිතව සැබෑ නෝට්ටු ද භාවිතා කළ හැක.

- ඔබ කඩයේ හිමිකරු (මුදලාලි) බවට පත් වන්න.

- නිවසේ සාමාජිකයන්ට කඩේ භාණ්ඩ මිලදී ගැනීමට පවසන්න .

- මිල දර්ශනය අනුව ගණන් බලා ගත් භාණ්ඩවල මුදල් පමණක් එකතු කරමින් ගෙවිය යුතු මුදල ලබාගෙන ඉතිරි මුදල් ලබා දෙන්න.

- මෙහිදී පළමුව මිල ගණන් දෙකක් එකතු කිරීමේ විවිධ ක්‍රම අත්හදා බලන්න.

  (මිල වැඩි භාණ්ඩයේ මිල සිට මිල අඩු භාණ්ඩයේ මිල තෙක් ඉදිරියට ගණන් කරමින් එකතු කිරීම)

- මෙම සෙල්ලම් කඩය තුළදී නිවසේ අය සමග නිතර නිතර ගනුදෙනු කරමින් මුදල් භාවිතය හා ගනුදෙනු කිරීම ආශ්‍රිත ගැටළු විසඳීමේ හැකියාව දියුණු කරගන්න.

සුවපත් දිවියක් පතමි!